www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මිලිටරිය නැගෙනහිර ආක්‍රමනික මෙහෙයුම උත්සන්න කරයි

## Sri Lankan military intensifies offensive in the East

**සරත් කුමාර විසිනි**
**2007 ජුලි 12**

ශ්‍රී ලංකා ආධාර සම්මේලනයේ සම-සභාපතිවරුන්ගේ -- එක්සත් ජනපදය, යුරෝපා සංගමය, ජපානය සහ නෝර්වේ -- මෑත රැස්වීම මගින් ප්‍රකාශයට පත් කරන ලද උත්සුකතා නොතකා හැර ඇති ශ්‍රී ලංකා ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ නැගෙනහිර පිහිටි අවසන් ප්‍රධාන කඳවුර විනාශ කිරීමේ ආක්‍රමනික මෙහෙයුම් ඉදිරියට ගෙන යමින් සිටී.

පසුගිය වසරේ ජුලි 16 දා මාවිල්ආරු ප්‍රදේශයට සිදු කල එල්ටීටීඊයට එරෙහි ප්‍රථම මිලිටරි ආක්‍රමනයේ සංවත්සරයට සමගාමීව ප්‍රධාන “ජාතික උත්සවයක්” පැවැත්වීමට ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව සැලසුම් කරයි. නැගෙනහිර නැගුම නමින් දැවැන්ත ආර්ථික සංවර්ධන සැලැස්මක් ආරම්භ කිරීමට ද එය සූදානම් වේ. නැගෙනහිර “මුදා ගැනීම” පිලිබඳව ආන්ඩුවට පුරසාරම් දෙඩීමට හැකි වන පරිදි තොප්පිගල ප්‍රදේශය අල්ලා ගැනීම සම්පූර්න කරන ලෙස මිලිටරියට බල කරනු ලැබ ඇත.

දේශ හිතෛෂී ප්‍රචාරක හා හිස් ආර්ථික පොරොන්දු ව්‍යාපාරය සැලසුම් කොට ඇත්තේ යුද්ධයට හා ජීවන මට්ටම් කඩා වැටීමට එරෙහිව වැඩෙන විරුද්ධත්වය යටපත් කර දැමීමට ය. ආන්ඩුව විවෘත මිලිටරි ආක්‍රමනය අරඹා වසරක් ගත වූ තැන අඩු ගනනේ 1,500ක් මරා දමා 250,000කට වඩා අවතැන් කර ඇත. මිලිටරියේ පිටුබලය ලබන ඝාතක කල්ලි විසින් සිය ගනනක් මරා දමා නැත හොත් “අතුරුදහන්” කරනු ලැබ තිබේ. අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ගනන් අඛන්ඩව අහස උසට නගිමින් පවතින්නේ අසන්තෘප්තිය හා වෛරය වර්ධනය කරමිනි.

පසු ගිය සති අන්තයේ *සන්ඬේ ටයිම්ස්* පත්‍රයේ පල වූ සමීක්ෂනයක් මගින් අනාවරනය කෙරුනේ ආන්ඩුවට ලැබෙන මහජන සහයෝගය ශීඝ්‍රයෙන් ඛාදනය වෙමින් පවතින බව යි. “සමීක්ෂනයෙන් ආවරනය කෙරුනු බොහෝ දෙනෙක් දරා ගත නොහැකි ආර්ථික බර පිලිබඳව පැමිනිලි කලහ. කොටි ගරිල්ලන්ට එරෙහිව දැන් සිදු වන මිලිටරි ව්‍යායාමට දෘඩතරව සහාය දෙන අය ද සිටි නමුත් ඔවුන් දැන් සිය අදහස් වෙනස් කර ගෙන තිබුනි. තමන්ට සැබෑ තත්වය වහංගු කරනු ලැබ ඇතැයි ද තමන් මත පටවනු ලැබ ඇති වැඩෙන දුෂ්කරතා ආවරනය කිරීමට යුද්ධය ආයුධයක් ලෙස යොදා ගෙන ඇතැයි ද ඔවුහු කියාපෑහ. ඔවුන්ගේ ම සමීක්ෂනවලින් සමහර රාජ්‍ය ඔත්තු සේවා ඒජන්සි ලබා ගෙන ඇති ප්‍රතිඵල ද මෙම අදහස් සමග ගැලපීම අර්ථභාරී ය.” යනුවෙන් ලිපිය සඳහන් කරයි.

ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයේ සම-සභාපතිවරු ශ්‍රී ලංකාවේ තත්වය ගැන තක්සේරුවක් කර ගැනීමට ජූනි 26 දා ඔස්ලෝ නුවර දී රැස්වූ අතර 2002 දී මෙම මන්ඩලය පිහිටුවීමෙන් පසු ප්‍රථම වතාවට මෙවර කිසිදු නිල නිවේදනයක් නිකුත් නොකලේ ය. ජුලි 1 දා *සන්ඬේ ටයිම්ස්* පත්‍රයට අනුව, එම රැස්වීම ශ්‍රී ලංකාවේ ආරක්ෂක හා දේශපාලන තත්වය, මානව හිමිකම්, අවතැන් වීම් හා පැහැර ගැනීම් ගැන සාකච්ඡා කල අතර එල්ටීටීඊය ගැන විවේචන ද සිදු කරන ගමන් ම “ආන්ඩුව මෙම කරුනු පිලිබඳව කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් ගැඹුරින් ම විවේචනශීලී” විය.

පුවත් පතට අනුව, සම-සභාපතිවරු තමන් සාකච්ඡා කල දේවල් පිලිබඳව දෙපාර්ශ්වය ම දැනුවත් කිරීමට නියමිතව තිබූ නමුත්, නෝර්වේජියානු සාම නියෝජිත ජෝන් හැන්සන් බවර්ට එල්ටීටීඊ නායකත්වය හමුවීමට යාම පිනිස අවසර දීමට ආන්ඩුව එකඟ වී ඇතැයි වාර්තා වූ කල මෙම සීමිත පියවරට පවා වහාම බාධාවන් එල්ල විය. එල්ටීටීඊ ගැත්තන් ලෙස මීට පෙර නෝර්වේ රට හෙලා දැක තිබූ සිංහල අන්තවාදී පක්ෂ එම සංචාරයට එරෙහිව වහාම උද්ඝෝෂනයක් ආරම්භ කලහ. එල්ටීටීඊයට සහයෝගය දීම පිනිස කිලිනොච්චියට යාමට සැලසුම් කරන්නේ යැයි ජවිපෙ මන්ත්‍රී විමල් වීරවංශ නෝර්වේජියානු සාම මැදිහත්කරුවන්ට චෝදනා කලේ ය. එවන් සංචාරයක් සිදු නොවන බව නෝර්වේජියානු තානාපති කාර්යාලය පසුව ප්‍රකාශ කලේ ය.

එල්ටීටීඊ-ගැති වනවා වෙනුවට. සම-සභාපතිවරු, එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගැනීමට නැවත නැවතත් මිලිටරි ආක්‍රමන දියත් කිරීම මගින් 2002 සටන් විරාම ගිවිසුම ආන්ඩුව විසින් විවෘතව උල්ලංඝනය කරනු ලැබීම නොදුටුවාක් මෙන් සිට ඇත. ශ්‍රී ලංකා ආන්ඩුව

හා මිලිටරිය විසින් මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් පැහැදිලිව ම උල්ලංඝනය කරනු ලැබීම නවතාලීමට මහ බලවතුන් කිසිදු පියවරක් ගෙන නැත. දැන් විවේචන සිදු කෙරෙන්නේ නම්, ඒ එල්ටීටීඊයට එරෙහි මිලිටරි ජයග්‍රහනයක් සඳහා රාජපක්ෂගේ පවතින ඉව බව නැති තල්ලුව ශ්‍රී ලංකාවේ හා වඩා පුලුල් ලෙස කලාපයේ දේශපාලන හා සමාජ අස්ථාවර භාවය තව දුරටත් තීව්‍ර කිරීමට එය හේතු වීම ගැන පවත්නා උත්සුකතා නිසා ය.

සන්ඩේ ටයිම්ස් වාර්තාවට අනුව, දෙමල සුලුතරයේ අව්‍යාජ දුක්ගැනවිලිවලට ආමන්ත්‍රනය කිරීමේ දේශපාලන යෝජනා මාලාවක් ගෙන එන ලෙස සම-සභාපතිවරු ඉල්ලා ඇත. සම-සභාපතිවරුන්ගේ රැස්වීම දිස්ත්‍රික් මට්ටමේ බලය බෙදා හැරීමක් සඳහා රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් කරනු ලැබ ඇති යෝජනා විවේචනය කර ඇත්තේ ඒවා ‘විශ්වාසනීය’ ලෙස සැලකිය නොහැකි බව පවසමිනි. මෙම අදහස් පල කිරීම වනාහි, සද්භාවයෙන් යුතුව සාකච්ඡා කිරීමේ හෝ පලමු කොට ම යුද්ධයට තුඩු දුන් දෙමල ජනයාට වෙනස්කම් කිරීමේ දශක ගනනාවක පිලිවෙතට ආමන්ත්‍රනය කිරීමේ කිසිදු අවශ්‍යතාවක් ආන්ඩුවට නොමැති බව නිහඬව පිලිගැනීමකි. දිස්ත්‍රික් මට්ටමේ පමනක් බලය බෙදා හැරීමට ශ්‍රීලනිපය කර ඇති යෝජනා 2002 සටන් විරාමයෙන් අනතුරුව පැවති සාකච්ඡාවල මෙන් ම යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් සොයා ගැනීමේ පෙර පැවති සියලු ප්‍රයත්නයන්ගේ පදනම සථල ලෙස ඉරා දමයි.

රාජපක්ෂ තවමත් සාම දූතයකු ලෙස පෙනී සිටීමට උත්සාහ කරන නමුත් ඔහුගේ ආන්ඩුව යත්න දරන්නේ එල්ටීටීඊය මිලිටරිමය ලෙස තලා දැමීමට යි. හමුදාව පසු ගිය වසරේ ජුලි මස සිට මේ දක්වා මාවිල්ආරු, මුතූර් නැගෙනහිර, සාම්පූර් හා වාකරෙයි ඇතුලු නැගෙනහිර පලාතේ ප්‍රධාන ප්‍රදේශ අල්ලා ගෙන තිබේ. ජූනි 8 දා, මඩකලපුවේ සිට කිලෝ මීටර් 40ක් බටහිරෙන් කැලෑ භූමියක පිහිටි තොප්පිගල එල්ටීටීඊ බල කඳවුරට එරෙහි මැතම ප්‍රහාරය ආරම්භ විය.

මිලිටරි වාරනය හේතු කොට ගෙන සටන පිලිබඳ ස්වාධීන වාර්තා කිරීම් නොමැත. පසු ගිය සිකුරාදා හා සෙනසුරාදා, එල්ටීටීඊ සටන්කරුවන් 15ක් මරා දැමූ බවත් මුහුදේ පැවති සටනක දී එල්ටීටීඊය පරාජය කල බවත් මිලිටරිය කියාපෑවේ ය. සඳුදා හමුදාව අල්ලා ගත් ප්‍රදේශවලට මාධ්‍යවේදීන් රැගෙන ගියේ ය. 1993න් පසු ප්‍රථම වතාවට සමස්ත නැගෙනහිර පලාත ම ආන්ඩුවේ පාලනයට යටත් කරමින් ජුලි අග වන විට මෙහෙයුම සම්පූර්න කෙරෙනු ඇතැයි ඉහල හමුදා අන දෙන නිලධාරියෙක් ඇසෝෂියේටඩ් ප්‍රෙස් ප්‍රවෘත්ති සේවයට පැවසී ය. තොප්පිගල මෙහෙයුම් තුල දී සොල්දාදුවන් 20කගේ හා නිලධාරින් දෙදෙනෙකුගේ ජීවිත පමනක් හානි කර ගනිමින් එල්ටීටීඊ සටන්කරුවන් 444ක් මරා දැමූ බවට සටන් බිමේ සිටින අන දෙන නිලධාරිහු කියාපාති.

මිලිටරිය කරන ප්‍රතික්ෂේප කිරීම් තිබිය දී ම, 2004 දී එල්ටීටීඊයෙන් භේද වූ තමිල් මක්කල් විඩුතලෙයි පුලිහල් (ටීඑම්වීපී) යනුවෙන් ද හැඳින්වෙන කරුනා කන්ඩායම සමග එය සමීප සහයෝගිතාවකින් ක්‍රියා කරයි. සන්ඩේ ටයිම්ස් පත්‍රයට අනුව, ටීඑම්වීපී ගරිල්ලාවරුන් තොප්පිගල ප්‍රදේශයට දකුනෙන් පිහිටි එල්ටීටීඊ ස්ථානවලට ප්‍රහාර එල්ල කරමින් එල්ටීටීඊයට අමතර භට කන්ඩායම් ගෙන ඒම කල නොහැකි බව සහතික කර තිබේ.

මිලිටරිය සිය උතුරේ ප්‍රහාරයන් ද උත්සන්න කර තිබේ. අඟහරුවාදා, මිලිටරියේ ගැඹුරු විනිවිදින කන්ඩායම්වලින් එකක් එල්ටීටීඊ පාලනය පවතින මාන්කුලම් ප්‍රදේශයේ ක්ලේමෝර් බෝම්බයක් පුපුරුවා හැර එල්ටීටීඊ භටයන් ද ඇතුලු වෛද්‍ය කන්ඩායමක සාමාජිකයන් පස් දෙනෙක් මරා දැමී ය. ගුවන් හමුදාව එල්ටීටීඊ පාලනය පවතින කිලිනොච්චි හා මුලතිව් ප්‍රදේශවලට විටින් විට එල්ල කරන ප්‍රහාර දිගට ම සිදු කර තිබේ. ආන්ඩුවේ න්‍යාය පත්‍රය පැහැදිලි කරමින් රාජපක්ෂ ජුලි 9 දා මෙසේ ප්‍රකාශ කලේ ය: ‘මේ රටට නිත්‍ය සාමය ගෙන එනු පිනිස, නැගෙනහිර පලාතෙන් ත්‍රස්තවාදීන් පලවා හැරි ආකාරයට ම ඉක්මනින් ම උතුරු පලාතෙන් ද ත්‍රස්තවාදීන් පලවා හැරීමට ආන්ඩුව කැප වී සිටී.’

තමන්ගේ ‘සාමය’ මගින් කුමක් අදහස් කෙරෙන්නේ ද යන වග ආන්ඩුව දැනට මත් ප්‍රකාශයට පත් කිරීම අරඹා ඇත. එම කතාවේ දී ම රාජපක්ෂ පැවසුවේ, ‘දශකයක කාලයක් තිස්සේ කිසිඳු ආන්ඩුවක් අත නොගැසූ ගැටලුවක් වන ගම්බද දුප්පත්කම අඩු කිරීම හා ඔවුන්ගේ විරැකියා ප්‍රශ්නය විසඳීම පිනිස නැගෙනහිර පලාතේ කර්මාන්ත ගනනාවක් ආරම්භ කිරීමට ආන්ඩුව ඉතා ආශාවෙන් සිටි නිසා නැගෙනහිර පලාත සංවර්ධනය කිරීමට බොහෝ විදේශ ආයෝජකයන් ගෙන ඒමට’ තමන් ‘සැලසුම් කරමින්’ සිටි බව යි.

දරිද්‍රතාව හා විරැකියාව තුරන් කරනවා වෙනුවට ආන්ඩුව සූදානම් වන්නේ නැගෙනහිර පලාතේ විශාල ප්‍රදේශ ආයෝජකයන් සඳහා ලාභ ශ්‍රම කලාප බවට පරිවර්තනය කිරීමට යි. මැයි මාසයේ දී රාජපක්ෂ පසු ගිය වසරේ එල්ටීටීඊයෙන් අල්ලා ගන්නා ලද මුතූර් නැගෙනහිර හා සාම්පූර් ප්‍රදේශවල විශාල කොටස් ඇතුලත් අධි ආරක්ෂක කලාපයක් නිල වසයෙන් ප්‍රකාශයට පත් කලේ ය. අධි ආරක්ෂක කලාපයට දේශීය හා විදේශීය ව්‍යාපාරිකයන් සඳහා වූ විශාල විශේෂ ආර්ථික කලාපයක් ඇතුලත් වනු ඇති අතර එය ප්‍රදේශයෙන් පලා ගොස් සිටින දහස් ගනන් ගම් වැසියන් යලි පැමිනීම වලකාලනු ඇත.

එමෙන් ම ආන්ඩුව නැගෙනහිර පලාත පුරා පොලිස් බලයක් ගොඩනැගීමට සූදානම් වේ. පොලිස්පති වික්ටර් පෙරේරාට අනුව, මඩකලපුව දිස්ත්‍රික්කය තුල නව පොලිස් ස්ථාන 2ක් හා පොලිස් මුරපොලවල් 25ක් පිහිටුවනු ඇත. ත්‍රිකුනාමලය තුල, අමතර පොලිස් ස්ථාන 5ක් හා පොලිස් මුරපොලවල් 9ක් පිහිටුවීමට නියමිත ය. අම්පාර දිස්ත්‍රික්කය තුල. නව පොලිස් ස්ථාන 2ක් හා පොලිස් මුරපොලවල් 8ක් පිහිටුවනු ඇත. මෑත මිලිටරි මෙහෙයුම්වලින් පසුව, හොඳින් සන්නද්ධ පොලිස් කොමාන්ඩෝ බලකායක් වන විශේෂ කාර්ය බලකාය (එස්ටීඑෆ්) දැනටමත් නැගෙනහිර පලාතේ නව කඳවුරු 33ක් පිහිටුවා ඇත.

ඔක්තෝබර් මාසයේ දී සම්පූර්න කිරිමට නියමිත විශේෂ බඳවා ගැනීමේ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක වන බව පෙරේරා පැවසී ය. පොලීසියට බඳවා ගැනීම භටයන් 50,000ක් බඳවා ගැනීමේ මිලිටරියේ සැලසුම්වලට අමතරව ය. *අයිලන්ඩ්* පුවත්පතට අනුවඃ "පොලීසිය හා එහි පැරා-මිලිටරි අංශය (එස්ටීඑෆ්) නැගෙනහිර පලාතේ යෙදවීම මගින් ශ්‍රී ලංකා යුද හමුදාව වන්නි කලාපයේ මෙහෙයුම් සඳහා නිදහස් කරනු ඇතැයි මිලිටරි හා පොලිස් නිලධාරිහු අවධාරනය කලහ. . . . එය අපගේ මූලෝපායේ කොටසකි."

දැන් ක්‍රියාත්මක වන්නේ නැගෙනහිර හා උතුරේ "මුදාගත්" ප්‍රදේශ දැවැන්ත සිර කඳවුරක් බවට පරිවර්තනය කිරීමේ එල්ලයෙන් යුතු ආරක්ෂක හමුදාවල අති මහත් ප්‍රසාරනයකි. නොවැලැක්විය හැකි ලෙසට ම, යුද්ධයට, මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් වැනසීමට හා වැඩ කරන ජනතාවගේ ජීවන මට්ටම් අඛන්ඩව ඛාදනය වීමට එරෙහිව දිවයිනේ අන් ප්‍රදේශවල වැඩෙන විරුද්ධත්වය මැඩීමට ද එය එල්ල කෙරෙනු ඇත.

© www.wsws.org